ලංකා
තේ පර්යේෂණායතනය

1967

වසර සඳහා
වාර්ෂික වාර්තාව

2වෙනි කොටස

ඊ. ඇම්. වෙනරි, බීඑස්සී, පීඑච්ඩී (ලංඩන්), ඒආර්සීඑස්, ඩීඅයිසී

හා

ආර්. එල්. ද සිල්වා, බීඑස්සී(ලංකා), පීඑච්ඩී (ලංඩන්), ඩීඅයිසී

විසින් සම්පාදිතයි

පරිවර්තනය

සී. ඇම්. ප්‍රණාන්දු, බීඒ(ලංකා)

විසිනි

තලවාකැලේ, සාන්ත කුම්බස්හී,
ලංකා තේ පර්යේෂණායතනය මගින් ප්‍රකාශිතයි.
1968

මණ්ඩලය

(1967 දෙසැම්බර් 31 වෙනි දිනට)

සභාපති — එෆ්. අමරසූරිය මහතා

නිලබල සාමාජිකයෝ

කෘෂිකර්ම අධ්‍යක්ෂක
එම්. එස්. පෙරේරා මහතා

ගරු මුදල් ඇමති
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ

සභාපති, ලංකා වැවිලිකරු සංගමය
බී. වරුසවිතාන මහතා

සභාපති, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය
ජී. අයි. ද ග්‍රැන්විල් මහතා

සභාපති, පහත රට නිෂ්පාදන සංගමය
ටී. සී. ඒ. ද සොයිසා මහතා

තේ පාලක
සී. පී. චංමුගම් මහතා

අධ්‍යක්ෂක, ලංකා තේ පර්යේෂණායතනය
ආචාර්ය ටී. එම්. වෙනරි

පත්කළ සාමාජිකයෝ

ලංකා වැවිලිකරු සංගමය මගින් පත් කළ අය
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ඒ. පී. පින්චර් මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත් කළ අය
පී. ජේ. සී. ඩරන්ට් මහතා
ටී. ඒ. මෝයි මහතා
එම්. බී. හෝස්පොල් මහතා

ලංකා පහත රට නිෂ්පාදන සංගමය මගින් පත් කළ අය
එෆ්. අමරසූරිය මහතා
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා

සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම හා අහාර ඇමති තුමා විසින් පත් කළ අය
ඩී. ටී. හෙට්ටි ආරච්චි මහතා
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්බීඊ

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා විසින් පත් කළ අය
මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා

ලේකම් — ඒ. සී. පෙරේරා මහතා

ලංකා තේ පර්යේෂණායතනය

නිලධාරි මණ්ඩලය

(1967 දෙසැම්බර් 31 වෙනි දිනට)

අධ්‍යක්ෂක මණ්ඩලය

අධ්‍යක්ෂක	... ර්. ඇම්. වෙනරි, බී.එස්.සී., පී.එච්.ඩී.(ලංඩන්) ඒ.ආර්.සී.එස්., ඩී.අයිසී.
නියෝජ්‍ය අධ්‍යක්ෂක	... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං)
සහකාර අධ්‍යක්ෂක	... එල්. එච්. ප්‍රනාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)

පර්යේෂණාංශ

කෘෂිකර්ම රසායන විද්‍යාව	...
උපදේශක	... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං)
කෘෂිකර්ම රසායනඥ	... වී. පී. බවානාදන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (එඩිං) ඒ.ආර්.අයි.සී.
පර්යේෂණ නිලධාරි	... ඩබ්. එම්. ඩබ්. බී. මනිපුර, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (කේම්බ්‍රිජ්)
පර්යේෂණ සහයකයෝ	... එස්. සන්දනම්, බී.එස්.සී. (ලංකා)
	එස්. සිවසුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා)
කර්මාන්තඥ සහයකයෝ	... වී. ප්‍රනාන්දු
	එස්. ජී. ජයසූරිය
	ටී. සී. ඉසෙඩ්. ජේමන්
	ටී. කුලරත්න, බී.එස්.සී. (ලංකා)
	සී. සී. රාජසිංහම්
	එම්. සිකුරාජපති, බී.එස්.සී. (ලංකා)
	ඒ. සෝමරත්න, බී.එස්.සී. (ලංකා)
	එස්. සුන්දරලිංගම්, බී.එස්.සී. (පූනා)
ජෛව රසායන විද්‍යාව	
ජෛව රසායනඥ	... ආර්. එල්. වික්‍රමසිංහ, බී.එස්.සී. (ලංකා) බී.එස්.සී. (ලංඩන්) පී.එච්.ඩී. (ෂෙෆීල්ඩ්) එෆ්.ආර්.අයි.සී.
ජෛව රසායනඥ (රස පිරියෙසුම්)	... ඒ. එස්. එල්. තිරිමාන්න, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)
පර්යේෂණ සහයකයෝ	... *ජී. ආර්. රොබර්ට්ස්, බී.එස්.සී. (ලංකා) ඒ. ආර් අයි.සී.
	*ආර්. ආර්. සෙල්වේන්ද්‍රන්, බී.එස්.සී. (ලංකා)
කර්මාන්තඥ සහයකයෝ	... යූ. එල්. එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංඩන්)
	බී. පී. එම්. පෙරේරා
	කේ. පී. ඩබ්. සී. පෙරේරා, බී.එස්.සී. (ලංකා)
	*කේ. සිවපාලන්, බී.එස්.සී. (ලංකා)
කෘමි විද්‍යාව	
කෘමි විද්‍යාඥ	... ඩබ්. දන්තනාරායන, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී.
පර්යේෂණ සහයක	... ඩී. ජේ. ඩබ්. රණවීර
කර්මාන්තඥ සහයකයෝ	... එස්. එන්. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා)
	එච්. බී. හේරත්, බී.එස්.සී. (ලංකා)
	ඒ. කදිරවෙට්පිල්ලෙයි, බී.එස්.සී. (ලංකා)
	සී. ෂන්මුගම්

---

*එතෙර පුහුණුව.

පැළෑටි ව්‍යාධි වේද හා වට පණු වේදය

පැළෑටි ව්‍යාධි විද්‍යාඥ	...	*එන්. ෂන්මුගනාදන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්)
පර්යේෂණ නිලධාරි	...	ආර්. එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී.
වටපණු විද්‍යාඥ	...	පී. සිවපාලන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (රට්ගර්ස්)
කර්මාන්තඥ සහයකයෝ	...	පී. වී. අරුල්ප්‍රගාසම්, බී.එස්.සී. (මද්‍රාසි)
		එස්. ආර්. ඒ. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා)
		ඒ. ආර්. එම්. හසීම්
		පී. ඒ. ජෝන්
		ටී. මනිවාසගර්
		එස්. මුරුගයියා
		ඩබ්. ආර්. එජ්. රුද්‍රිගු, බී.එස්.සී. (ලංකා)
		එස්. සමරජීව
		ටී. වී. සරවනපාවන්, බී.එස්.සී. (ලංකා)

පැළෑටි භෞත වේදය

පැළෑටි භෞත විද්‍යාඥ	...	ශූ. පෙතියාගොඩ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී.
පර්යේෂණ නිලධාරි	...	වී. එස්. කුලසේගරම්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ජෛ.වි.සා.
පර්යේෂණ සහයකයෝ	...	එස්. කන්දයියා, බී.එස්.සී. (ලංකා)
		එස්. නාගරාජා, බී.එස්.සී. (ලංකා) එම්.එස්. (කැලිපෝනියා)
		ඒ. ආර්. සෙබස්තියන් පිල්ලේ, බී.එස්.සී. (ලංකා)
කර්මාන්තඥ සහයකයෝ	...	ඒ. එස්. බී. ගෝමස්, බී.එස්.සී. (ලංකා)
		ඩී. ජානකිරාම්, බී.එස්.සී. (මද්‍රාසි) එම්.එස්.සී. (නව දිල්ලි)
		එස්. ක්‍රිෂ්ණ පිල්ලේ, බී.එස්.සී. (ලංකා)
		ඒ. නානායක්කාර, බී.එස්.සී. (ලංකා)
		එච්. ආර්. සොලොමන්
		එච්. බී. විජේතුංග
		එස්. විමලධර්ම

සංඛ්‍යාති

සංඛ්‍යා ලේඛනඥ	...	පී. කනපතිපිල්ලේ, බී.එස්.සී. (ලංඩන්) එෆ්.එස්.එස්.
කර්මාන්තඥ සහයක	...	කේ. සිවරත්නම්

කර්මාන්ත ශිල්පාංශය ...

කර්මාන්ත ශිල්පඥ	...	ඩී. කීර්තිසිංහ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී. කේ.එන්ජී. ඒඑම්.අයි. කෙමී.ඊ.
තේ රසඥ	...	සී. එච්. වික්‍රමසිංහ
සංවර්ධන ඉංජිනේරු	...	ඩබ්. ජෝෂප්, බී.එස්.සී. (ලංකා)
පර්යේෂණ සහයකයෝ	...	එන්. එම්. අබ්දුල් ගපාර්, බී.එස්.සී (ලංකා)
		*ඩබ්. සී. ඒ. ද සිල්වා, බී.එස්.සී. (ලංකා)
කර්මාන්තඥ සහයකයෝ	...	ඩබ්. ඒ. සී. ද සිල්වා
		එස්. සමරසිංහම්
		ඒ. තේවදසන්, බී.එස්.සී. (ලංකා)

* එතෙර පුහුණුව

ප්‍රාදේශීය සේවය

පහත රට සේවය

සහකාර අධ්‍යක්ෂක	...	එල්. එච්. ප්‍රනාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)

පහත රට ස්ථානය රත්නපුර

පර්යේෂණ නිලධාරි	...	ඩී. ටී. වෙත්තසිංහ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (රෙඩිං)
ප්‍රාදේශීය උපදෙස් නිලධාරි	...	*ජේ. වී. සබානායගම්, බී.එස්.ඒ. (ටොරොන්ටෝ)
කර්මාන්තඥ සහයකයෝ	...	ඊ. ජේ. බී. ද සිල්වා, බී.එස්.සී. (ලංකා)
		සී. කන්දප්පා, බී.එස්.සී. (ලංකා)
		ඒ. ඒ. සී. කරුණාරත්න, බී.එස්.සී. (ලංකා)
		ඩී. ඩී. කෘෂ්ණන්
		එන්. එස්. රාජේන්ද්‍රම්, බී.එස්.සී. (මද්‍රාසි)
		*ටී. එජ්. සල්දීන්, බී.එස්.සී. (ලංකා)
		එච්. එච්. සමරකෝන්
		යූ. පී. ද එස්. වෛද්‍යානාත, බී.එස්.සී. (ලංකා) එම්.එස්.සී. (ලංකා)
		එන්. යෝගරත්නම්, බී.එස්.සී. (අලහබාඩ්)
පරිපාලක නිලධාරි	...	සී. කීර්තිරත්න, එජ්.සී.සී.එස්.
ප්‍රධාන ලිපිකරු	...	ආර්. අයි. පෙරේරා
ලඝුලේඛක	...	එස්. කේ. පී. තම්බිමුත්තු
ගණක ලිපිකරු	...	කේ. ඩී. බී. එච්. අබේගුණවර්ධන
විදුලි වැඩකරු	...	බී. ටී. රණසිංහ
වැඩ ලිපිකරු	...	ටී. ඩී. වී. කුරේ

කොට්ටාව අතුරු ස්ථානය තල්ගම්පොල

කාර්ය භාර නිලධාරි	...	කේ. එච්. ජී. ගුනපාල
කර්මාන්තඥ සහයක	...	එච්. ඩී. ජයසිංහ

දෙනියාය

කර්මාන්තඥ සහයක	...	ජේ. අයි. එච්. බණ්ඩාරනායක

මැද රට සේවය

මැද රට විද්‍යා නිලධාරි	...	ඩී. කාල්නයිදු, බී.එස්.සී. (ලංකා). පී.එච්.ඩී. (ලංඩන්)
ප්‍රාදේශීය උපදෙස් නිලධාරි	...	එම්. කේ. වෛතිලිංගම්
කර්මාන්තඥ සහයකයෝ	...	ටී. ඒ. මුණසිංහ
		එච්. බී. රත්නායක
		කේ. තිරුඥණසුන්දරන් බී.එස්.සී. (ලංකා)

ඌව ස්ථානය

වැඩ බලන ප්‍රධාන උපදෙස් නිලධාරි	...	එල්. එම්. ද ඩබ්. තිලකරත්න, බී.එස්.සී. (ලංකා) එම්.ඊ.ඩී. (කැලිපෝනියා)
කර්මාන්තඥ සහයකයෝ	...	ඒ. එම්. අබේසිංහ
		එන්. එල් සී. ප්‍රණාන්දු, බී.එස්.සී. (ලංකා)
		එම්. ටී. සුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා)
ගණක ලිපිකරු	...	ටී. ආර්. බී. සලේ
ලිපිකරු	...	ඒ. සී. පෙරේරා

උපදෙස් සේවය

වැඩබලන ප්‍රධාන උපදෙස් නිලධාරි ...	එල්. එම්. ද. ඩබ්. තිලකරත්න, බී.එස්.සී. (ලංකා) එම්.ඊ.ඩී. (කැලිෆෝනියා)
පර්යේෂණ සහයක ...	ආර්. කේ. නැතැනියෙල්, බී.එස්.සී. (පූනා)

ප්‍රාදේශීය උපදෙස් නිලධාරීහු

පහතරට ...	ජේ. වී. සබානායගම්, බී.එස්.සී. (ටොරොන්ටෝ)
මැදරට ...	එම්. කේ. වෛතිලිංගම්
ඡායාරූප ශිල්පි ...	ඩී. ජේ. එම්. හෙට්ටිආරච්චි

වතුයාය

සාන්ත කූම්බ්ස්

කෘෂිකර්මාන්තඥ ...	එල්. ඒ. සීවරත්නම්, බී.එස්.සී. (ඩුනෙම්)
ප්‍රධාන කම්හල් නිලධාරි ...	වී. ඒ. ෆනැන්ඩස්
වැඩබලන මුල් වැඩකරු ...	එච්. එන්. ද සිල්වා
ඇපොතිකරි ...	එස්. පී. ද සිල්වා
ක්ෂේත්‍ර නිලධාරි ...	ඩබ්. ආරියපාල

සාන්ත ජෝයකිම්

අධිකාරි ...	ජී. එස්. මුත්තෙට්ටුවේගම
ප්‍රධාන කම්හල් නිලධාරි ...	එම්. එස්. ඩබ්. විජේරත්න
මුල් ලිපිකරු ...	ජී. එල්. ඒ. තෝමස්
ක්ෂේත්‍ර නිලධාරි ...	ඩී. ඩී. පතිනායක

පරිපාලනය

ප්‍රධාන පරිපාලක නිලධාරි ...	ඒ. සී. පෙරේරා
ගණකාධිකාරි ...	එච්. එස්. ගුණවර්ධන, බී.ඒ. (ලංකා)
අධ්‍යක්ෂකගේ ලේකම් ...	ජී. ඒ. එස්. ගුනසිංහ
පරිවර්තක-උපදේශක ...	සී. ඇම්. ප්‍රණාන්දු, බී.ඒ. (ලංකා)

ගණක අංශය

ගණක සහයක ...	ඒ. එච්. බී. ඩයස්
වැඩ බලන ප්‍රධාන ලිපිකරු ...	ඩබ්. ජේ. සැමුවෙල්
වැඩබලන දෙවු ගණක ලිපිකරු ...	එම්. බී. පැලිස්
අභ්‍යාන්තර විගණන නිලධාරි ...	අයි. රෙංගරාජ්
ගණක ලිපිකරුවෝ ...	එච්. අත්තනායක
	ජී. ඒ. කේ. පී. ද සිල්වා
	කේ. පී. ගුණවර්ධන
	එන්. එම්. ජයතිලක
	එස්. කුලසබානාදන්
	එන්. සච්තානන්දන්
	යූ. සී. උනම්බුව
	සී. බී. වරාවිට
	ඩී. ඩබ්. වික්‍රමරත්න
	එච්. සී. වික්‍රමසිංහ

යතුරු ලියනාංශය

ලඝුලේඛකයෝ ...	ඊ. සී. සී. බ්‍රෝහියර්
	එස්. ඒ. එල්. එච්. ප්‍රණාන්දු
	ටී. ජේ. හලල්දීන්

		බී. පී. ජෝන්ස්
		පී. ඩබ්. උඩුවාවල
		එස්. ඩී. ජේ. ජේ. විතාරනපතිරන
ලිපිකරු යතුරු ලියන්නෝ	...	ජේ. ඇන්. ඇපාසිංහ
		ඩී. ඩබ්. බර්තොලෝමියුස්
		සී. වී. ආර්. ඩී. පොන්සේකා
		වී. කෝදාගොඩ
		එස්. බී. වැත්තෑව
වාර්තා ලිපිකරු	...	කේ. එල්. ද අල්විස්
තැපැල් ලිපිකරු	...	එච්. ඩබ්. පෙරේරා

වැඩ අංශය

විදුලිබල ෆෝර්මන්	...	ඩබ්. ආර්. සොලොමන්
වැඩ ලිපිකරු	...	ආර්. ඒ. ඩැනියෙල්
ගබඩාකරු	...	අයි. පී. දිසානායක
මිකැනික්වරු	...	ඩී. ඒ. එස්. ඕපාත
	...	කේ. එස්. වඩිවේලු
විදුලි ශිල්පි	...	කේ. ඒ. බෝවි
ලිපිකරු (වැඩ)	...	කේ. එච්. ටී. දසනායක

අධ්‍යක්ෂකවරයාගේ වාර්තාව

ඊ. එම්. වෙනරි, බී.එස්.සී., පී.එච්.ඩී., ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.

පූර්විකා

වානිජමය පදනමක් මත ලංකාවේ තේ වගා කොට ශත සාංවත්සරයක් පිරෙන එක්දහස් නව සිය හැටහත් වෙනි වසර, ලංකා තේ පයෙෂණායතනය මගින් සම්මේලන වාරයක් පැවැත්වීමෙන් උත්සවාකාරයෙන් සිදු කරන ලදි. රදැල්ල සමාජ ශාලාවෙහි පවත්වන ලද මෙම සම්මේලනය විවෘත කරන ලද්දේ ගරු අග්‍රාමාත්‍ය තුමා විසිනි. දින හතරක පෙරවරුවේදී කථක වාර පවත්වනු ලැබූ අතර පස්වරුවේදී ක්ෂෙත්‍ර උපදෙශනයන් හා කම්හල් උපදේශන වැඩ සටහනක් තිබිණ. ප්‍රධාන සම්මේලන වාරයට දින කිහිපයකට පසුව පහත රට වැවිලිකරුවෝ සාන්ත ජොයකිම්හි තෙදිනක ක්ෂෙත්‍ර වැඩ සටහනකට සහභාගි වූහ. ආයතනයේ කෙරෙන කටයුතු, කොළඹ පැවැති තේ ශත සාංවත්සර ප්‍රදර්ශනයේදී ද ප්‍රදර්ශනය කරණු ලැබීය.

ආයතනයේ විද්‍යාඥයන් නියැලී සිටින සෑම පයෙෂණ කටයුත්තකම පාහේ ප්‍රගතියක් ඇති විය. ඔවුන් ගේ කටයුතුවල වඩා වැදගත් ප්‍රතිඵල, පයෙෂණ පිළිබඳ සාරාංශයන් දක්වා ඇති විවිධ අංශ යටතේ දැක්වේ.

කාර්‍ය මණ්ඩලය

විදෙස් නිවාඩු හා රාජකාරි නිවාඩු පිට අධ්‍යක්ෂකවරයා මැයි 10 වෙනිද සිට අගොස්තු 15 වෙනිද තෙක් දිවයිනෙන් බැහැරව සිටියේය. ඔහු දිවයිනෙන් බැහැරව සිටි කාලයේ දී ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා ඔහු වෙනුවට වැඩ බැලීය. ආයතනයේ අවුරුදු හතක පමණ සේවයෙන් පසු සී. බී. පොස්ටර් බාර්හැම් මහතා ජූනි 8 වෙනි දින ප්‍රධාන උපදෙස් නිලධාරි තනතුරෙන් අස් විය. නොවැම්බර් 2 වෙනිද සිට ආචාර්‍ය වී. පී. බවානන්දන් කෘෂිකර්ම රසායනඥ වශයෙන් ද ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා කෘෂිකර්ම රසායන විද්‍යාව පිළිබඳ උපදේශක වශයෙන් ද පත් කරන ලදි.

එල්. එම්. ද ඩබ්ලිව්. තිලකරත්න මහතා ජනවාරි 1 වෙනිද සිට ඌව විද්‍යා නිලධාරි වශයෙන්ද (දෙවු නිලධාරී ශ්‍රෙණිය) ජූනි 4 වෙනි ද සිට වැඩ බලන ප්‍රධාන උපදෙස් නිලධාරි වශයෙන් ද පත් කරන ලදි. අගොස්තු පස් වෙනි ද සිට එච්. එස්. ගුණවර්ධන මහතා ගණකාධිකාරි (දෙවු නිලධාරී ශ්‍රෙණිය) වශයෙන් පත් කරනු ලැබීය.

අප්‍රියෙල් 16 වෙනි ද සිට, එන්. එම්. අබ්දුල් ගපාර් මහතා කර්මාන්ත ශිල්පාංශයේ පයෙෂණ සහයක වශයෙන් ද, අප්‍රියෙල් 25 වෙනි ද සිට සී. කීර්තිරත්න මහතා පහත රට ස්ථානයේ පරිපාලක නිලධාරී වශයෙන්ද පත් කරන ලදහ.

විවෘත තරඟයකින් පසුව පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයක් දිනා ගත් ආචාර්‍ය එන්. ෂන්මුගනාදන් අගෝස්තු 30 වෙනි ද කැනඩාව බලා පිටත් විය. ටී. එජ්. සල්දීන් හා පී. වී. අරුල්ප්‍රගාසම් යන මහතුන්ට කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. සල්දීන් මහතා කැනඩාවේ මොන්ට්‍රියල් හී මැක්ගිල් විශ්ව විද්‍යාලයයේ ද, අරුල්ප්‍රගාසම් මහතා ලංඩනයේ වයි විද්‍යාලයයේ ද කටයුතු කරනු ඇත.

ඩබ්. එම්. ඩබ්. බී. මනිපුර මහතා කේම්බ්‍රිජ් සිට පී.එච්.ඩී. උපාධිය ලැබ මැයි 24 වෙනිද ආපසු දිවයිනට පැමිණියේය. ඩබ්. ජොශප් මහතා එක්සත් රාජධානියේ විවිධ කටයුතුවලින් පසුව ඒ. එම්. අයි. මිකැ. ඊ. ලැබ නැවත දිවයිනට පැමිණියේය. ටී. සී. ඉසෙඩ්. ජේමන් හා ඩී. ජානකීරාම් යන මහතුන් පිළිවෙළින් ඕස්ට්‍රෙලියාවේ හා ඉන්දියාවේ සිට ආපසු පැමිණියේය.

ආචාර්‍ය ආර්. එල්. වික්‍රමසිංහ හා ආචාර්‍ය ඒ. එස්. එල්. තිරිමාන්න, අගෝස්තු වේදී, ජපානයේ ටෝකියෝ නුවර පැවැති ජාත්‍යන්තර ජෛව විද්‍යා සම්මේලනයේ 7 වෙනි වාරයේ දී පත්‍රිකා ඉදිරිපත් කළහ. ජූනි 10 වෙනි ද සිට 18 වෙනි ද දක්වා මොස්කව් නුවර පැවැති ජාත්‍යන්තර පරිමාණ සංවිධානයේ රැස්වීම්වලට ආචාර්‍ය ඩී. කීර්තිසිංහ සහභාගිවුනේය. ආචාර්‍ය එල්. එච්. ප්‍රණාන්දු නොවැම්බරයේදී 23 වෙනි ටොක්ලායි සම්මේලනයට සහභාගි විය. ආචාර්‍ය ඩී. කාල්නයිදු සහ එල්. එම්. ද ඩබ්. තිලකරත්න මහතා සැප්තැම්බරයේ පැවැති දකුණු ඉන්දියානු එක්සත් වැවිලිකරුවන්ගේ 14 වෙනි වාර්ෂික සම්මේලනයට සහභාගි වූහ.

පර්යේෂණ

කෘෂිකර්ම රසායන විද්‍යාව

කෘත්‍රිම පොහොර යෙදීම පිළිබඳ අත්හද බැලීම් රාශියක් ස්ථිර පලදව ලැබෙන තත්ත්වයකට පත්ව ඇත. නව වගාවන් සඳහා මුල් වර්ෂවල හොඳින් පොහොර යෙදීමේ අගය තහවුරු වී ඇති බව පෙනිණ. සාමාන්‍ය වශයෙන් ඉතා කුඩා ප්‍රදේශයක පවා ස්ථානයේ ඇති වෙනස් කම් අනුව පොහොර යෙදීම හා ඵලද ප්‍රති ක්‍රියා පිළිබඳ පැහැදිලිවම පෙනී ගිය අතර, උපදෙස් දීම සඳහා පදනම්කර ගැණීමට මීට වඩා සවිස්තරාත්මක අත්හද බැලීම්ද පස් පිළිබඳ පරීක්ෂණයන්ද අවශ්‍ය බව පෙනේ.

උඩරට බීජමය තේ සඳහා වසරකට දෙවරක් පොහොර යෙදීම, එම පොහොර වසරකට සතර වරක් යෙදීමෙන් ලැබෙන පලද ප්‍රමාණයක් ලබාගත හැකි බව පෙන්නුම් කෙරිණ. [සෑම පේලියකම පෝර ඉසීම වෙනුවට පේළි එකක් හැර එකක් අතර පොහොර යෙදීමෙන් ද සතුටුදායක ප්‍රතිඵල ගෙන දුනි. දළ ස්වරූපයක් සහිත යූරියා යෙදීම සම්-බන්ධයෙන් පොහොර වැඩ සටහන් සකස් කරන්නට වන විට මේ ප්‍රතිඵල ඉතා වැදගත් විය හැකිය.

ජීවාන්තක කෘතිම පොහොර වර්ග තුනක් අතර මේ දින වන විට ඉතා සුළු වෙනසක් පමණක් සොයා ගෙන ඇත. ගබඩා කර තැබීම හා යූරියා කැට ස්වරූපයෙන් අනෙක් පොහොර හා මිශ්‍ර කොට තැබීම පිළිබඳව ගෙන යන ලද අත්හද බැලීම් ඉතා පොරොන්දු සහිත විය.

සින්ක් සල්පේට් යෙදීමෙන් ඵලදව වැඩිවිය. මේ නිසා වසරකට අක්කරයකට රාත්: 15 සිට 20 දක්වාවූ සින්ක් සල්පේට් ප්‍රමාණයක් හතර පස් වතාවකට සමව බෙදෙන සේ යෙදීම නිර්දේශ කරන ලදි. සල්පේට් ඔප් ඇමෝනියා, යූරියා හා කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් අතර සෑහෙන වෙනසක් නොමැතිය. හුණුවල වතුයායේ පමණක් කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් ඉතා හොඳ විය. පස නැවත සැකසීම පිළිබඳව සාන්ත ජොයකිම් වතුයායේ අත්හද බැලීම් ගණනාවක් ඇති කෙරිණ. අත්හද බැලීම් පෙදෙස්වලින් එන ප්‍රතිඵල අනුව පෙනී යන්නේ පස සෝද යෑමක් නොමැති නම් තේ ඉඩම්වල, පස සංරක්ෂණය නොකොට නැවත තේ වගා කළ හැකි බවය. ක්ලෝන අත්හද බැලීම්වල තේ.පර්.ආ. 2023 හා 2026 අනෙක් ක්ලෝනයන්ට වඩා සුපිරි බව පෙණින. සාන්ත ජොයකිම් හා කොට්ටාවෙහි, කුම්බ්වුඩ් 21 ඉතා හොඳින් වැවේ. බලංගොඩ කණ්ඩායමෙහි හොඳම ක්ලෝනය වූයේ තේ.පර්.ආ. 2024 ය. නිසරු පස් අතර තේ.පර්.ආ. 2023 ප්‍රතිඵල ඉතා අසතුටුදායක විය. නියඟයනට ඔරොත්තු දීම පිළිබඳ අත්හද බැලීම් බලංගොඩ රයි වතුයායේ දී කරන ලදි. සෙවන ගස් යෙදීමෙහි ඵල විපාක විමසන අත්හද බැලීම්වල සෙවන ඉවත් කරන පළමු හය මාසයේ දී ඵලදව අඩුවන බවත් පසුව ඵලදව වැඩිවන බවත් පෙනී යේ. වල් නැසීම සඳහා ග්‍රැමොසොන් යොදන තැන්වල තෘණ, මහත් ගැටළුවක් විය. මුල් වාරයට සති දෙකක් හෝ තුනකට පසුව ග්‍රැමොසෝන් යෙදීමට අතිරේකව කම්කරුවන් යොද අතින් වල් නෙලීම වෙනුවට නැවතත් ග්‍රැමොසෝන් යෙදීම බලගතු බව පෙනී ගියේය.

ශාක ප්‍රචාරණය

විවිධ වූ පරිසර හතරක, 1961 සිට වාර්ෂිකව නෙළන ලද ක්ලෝන අත්හද බැලීම් පිළිබඳ පයෝෂණ තව දුරටත් ගෙන යන ලදි. තොරතුරු රාශියක් ලබාගත හැකිවූ අතර විවිධ පරිසර අනුව ඉතාම සුදුසු ක්ලෝනයන් නිරීක්ෂණය කිරීම සඳහා පොදු ලක්ෂණ දන් සකස් කළ යුතුව ඇත. මෙම අධ්‍යායනයන් ගේ මීලඟ ප්‍රයත්නය වනුයේ මෙම කටයුතු ව්‍යාප්ති කිරීමට වඩා ලැබී ඇති තොරතුරු තවත් තහවුරු කර ගැනීමය. වැඩි ඵලදව දීමට හිතකර වන, ක්ලෝනයන් ගේ සහජ ලක්ෂණ දනගැනීම පිළිබඳ වර්තමාන කටයුතු ද ඉතා වැදගත්ය. මෙම නිරීක්ෂණයන් සාර්ථකව අවසාන කළ හැකි වෙතොත් පොරොන්දු සහිත ක්ලෝනයන් තේරීමටත්, දුර්වල තේ ඉවත් කිරීමටත් ගතවන කාලය කෙටි කළ හැකිය.

ශාක භෞත වේදය

වැලිවගාවන් හී වවන ලද තේ පෝෂ්‍යදායී කරුණු පිළිබඳ අධ්‍යයනයන් හී, වසර තුල ඉතා සතුටුදායක ප්‍රගතියක් ලබා ගත හැකිවිය. ඉතා වැදගත් පෝෂ්‍යදායී ද්‍රව්‍යයන් රාශියක ඌණතාවය සාර්ථකව ප්‍රේරිත වූ අතර ඒවා විස්තරාත්මකව වාර්තා කර ගනු ලැබීය. මේවායින් බොහොමයක් තව දුරටත් අධ්‍යයනය කිරීම අවශ්‍ය බව පෙන්නුම් කරයි.

නෙලීමට ගෙන ඒමේ මාර්ග, දළු නෙළීම, කප්පාදු කිරීම, වසුන් කිරීම, හුලංවලින් ආරක්ෂා කිරීම, ආදිය සම්බන්ධ රෝපිත ක්‍රම පිළිබඳ නිරීක්ෂණයන් ගේ සැහෙන ප්‍රගතියක් ලැබිණ. පසෙහි පොහොර තිබීම හා කප්පාදුවෙන් දුර්වලව ලියැලීම පිළිබඳ සම්බන්ධයන් ඇතැයි සාක්ෂි තිබුනෙත් මෙම තත්ත්වය මහ හරවා ගැනීමට තාවකාලික නිර්දේශ කරන ලදි.

ශාක ව්‍යාධි වේදය

පෝරියා මුල් රෝගය, මීතයිල් බ්‍රෝමයිඩ් පසට ධූමායනය කිරීමෙන් සම්පූර්ණ වශයෙන් මර්ධනය කිරීම පිළිබඳ ආයතනය විසින් නිර්දේශ කිරීමෙන් පසුව උඩ රට බොහෝ වතුයායන් පෝරියා මර්ධනය පිළිබඳ වැඩ සටහනක් සකස් කර ගැනීමට උත්සුක විය. මෙම පයෙෂණ නිසා පහල වන ප්‍රයෝජන දැනටමත් වතුයා මගින් නෙළා ගනු ලැබේ. කලින් නිර්දේශ ක්‍රියා මාර්ගය නිසා දරන්නට වන අධික වියදම නිසාද, කටයුතුවල බරපතලකම නිසාද මෙම වතුයාවලට කිසිවක් කර ගත නොහැකිවිය.

පී. හයිපොලැටරිෂියා මර්ධනය කරනවාක් මෙන්ම මීතයිල් බ්‍රෝමයිඩ් රොසලිනියා අර්කුඒටා ද හොඳින් මර්ධනය කරන බව සොයා ගනු ලැබීය. ආර්. අර්කුඒටා මහත් ප්‍රශ්නයක් වන ඌව ප්‍රදේශයනට මෙම සොයා ගැනීම් මහත් සහනයක් වනවා ඇත.

බුබුලු අංගමාරයෙහි අපිවර්මීය ලක්ෂණ පිළිබඳ අධ්‍යායනයන් තව දුරටත් ගෙන යන ලදි. රෝගයෙහි මූලික සිද්ධාන්ත පිළිබඳ කරුණු සොයා ගන්නා ලදි. බුබුලු අංගමාරය හේතුවෙන් ඵලදාව අඩුවීම පිළිබඳ අත්හද බැලීමෙහි ලද ප්‍රතිඵල ඉතාමත් සතුටුදායකය. මෙහි තාවකාලික ප්‍රතිඵලයක් වූයේ දිලීර නාසකය යෙදීම අඩුකරන ලෙස වතුයායනට උපදෙස් දීමය. මේ හේතුවෙන් නිෂ්පාදන වියදම අඩුවූ අතර විදේශ විනිමය වියදම් වීමද අඩුවිය. බෙහෙත් විදීම පිළිබඳ නව වැඩ සටහණ සෑම වතුයායකම අනුගමනය කරනු ලබන විට මේ හේතුවෙන් තේ කර්මාන්තයට වසරකට ලක්ෂ 100 ක් පමණ ඉතිරි වේ.

තරුණ තේ වල අතු හා කඳ දිරා යෑමේ රෝග පිළිබඳ තවත් තොරතුරු ලබාගත හැකිවිය. පසෙහි තෙතමන ගතිය රෝග වර්ධනය කෙරෙහි ඉතා තදින් බලපාන බව පෙණින. මෙම දිලීරයෙහි විවිධ මාදිලියන් ඇතැයි සොයා ගනු ලැබූ හෙයින් රෝග මර්ධනය සඳහා රෝගයට ඔරොත්තු දෙන ක්ලෝනයන් වැවීම නිර්දේශ කිරීම එතරම් ස්ථිර පියවරක් නොවනුයේ දිලීරයෙහි එක් මාදිලියකට ඔරොත්තු දෙන ක්ලෝනයන් තවත් මාදිලියකට ඔරොත්තු දිය නොහැකි හෙයිනි. එසේ වුවද රෝගයට අවනත වන බව ප්‍රකට ක්ලෝනයන් රෝග වැළැදී පෙදෙස්වල වගා නොකළ යුතුයයි නිර්දේශ කරන ලදි.

වටපණු වේදය

සාම්පලයන් සඳහා පස් ගනු ලබන ගැඹුරු ප්‍රමාණයත්, ප්‍රැටිලෙන්කස් ලූසායි ජනගහනය ව්‍යාප්තිවීමත් අතර ඇති සම්බන්ධය පිළිබඳව කරන ලද නිරීක්ෂණයන් ගෙන් පෙනී ගියේ විවිධ ගැඹුරු ප්‍රමාණයන් හා රෝග තත්ත්වය පිළිබඳ සැහෙන වෙනසක් තිබෙන බවය.

උපරිම රෝග තත්ත්වයක් දක හැකි වූයේ පළමු අඟල් 6 යෙහිය. ඊට පසු දෙවන හා තුන්වන අඟල් 6 යේ ප්‍රමාණයන් අතරෙහිය. අවුරුද්දේ විවිධ කාලයක් තුල දීද රෝග තත්ත්වය පිළිබඳ සැහෙන වෙනස්වීම් සොයා ගත හැකිවිය. එහෙත් සිරස් අතට ජනගහනය පැතිර යෑම නම් සෑම විටම එක සමාන විය.

1966/67 දී ගෙන යන ලද රෝග ධාරණය පිළිබඳ පරීක්ෂණයන් සඳහා ගන්නා ලද දෙමුහුන් ක්ලෝනයන් තිස් දෙක අතුරෙන් හයක් එක සමානව නැතහොත් පිළිගත් රෝගධාරණ ක්ලෝනය වන ටී. 95 ට වැඩියෙන් ප්‍රතිධාරණ බව පෙනිණ. මේ ක්ලෝන-යන් ගෙන් හතරක් ටී.ආර්.අයි. × ඩීටී 1, මුහුන් ඒවා විය. අනෙක ටී.ආර්.අයි. 1114× ඩීටී 95 දෙමුහුන් විය.

සංරක්ෂණ කාලයේදී ද, නැවත වගා කිරීමෙන් පසුව ද වටපණු සංඛ්‍යාවන් පිළිබඳව ඉදිරිමේ ක්‍රම දෙකක ප්‍රතිඵල සැසැඳීම තවම සම්පූර්ණ කොට නැත. දනට ලැබී ඇති ප්‍රතිඵලයන් ගෙන් පෙනී යන්නේ අතින් උදුරන ලද පෙදෙස්වල තරුණ තේ මුල් අතර වටපණුවන් බෝවීමේ ප්‍රමාණය අධික බවය. වින්ච් ක්‍රමයට ඉදුරු පෙදෙස්වල බෝවීමේ

ප්‍රමාණය මඳ බවය. පරණ තේ වින්ච් ක්‍රමයට ඉදිරිම ද වට පණුවන් මර්ධනය සඳහා ප්‍රමාණවත් නොවේ. වින්ච් කිරීමට පසුව මුල්ලු ගැමෙන් මුල් කැබෙලි ඉවත් කිරීම ද කළ යුතු වේ. පැල සිටුවීමට පෙර පස ප්‍රතිකාර කිරීමේ අත්හද බැලීම්වලින් පෙනී ගියේ ක්ෂෙත්‍ර පරිමාණයෙන් මෙඩෝ වට පණුවන් මර්ධනය සඳහා හොඳම ධූමකය මීතයිල් බ්‍රෝමයිඩ් බවය. භාවිතා කරනු ලබන ඉතා අඩු ප්‍රමාණයේ දී පවා එය එසේ විය. (වර්ග අඩි 100 ට රාත්: 1 1/2). මීතයිල් බ්‍රෝමයිඩ් හා සංසන්දනය කරන විට එතරම්ම බලගතු නොවූව ද, නව ධූමායකයක් වන ඩබ්එන්—12, ඩීඩී වලට වඩා බලගතු බව පෙණුන. (ඩීඩී ගැලුම් 40 වෙනුවට අක්කරයකට ඩබ්එන්—10 බැගින් යෙදීමෙන් පවා), වටපණුවන් මර්ධනය කිරීමේ පිළිගත් පිළිවෙතක් වශයෙන් තවාන් පස සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් ඉසීම දැන් නිර්දේශ කරනු ලැබේ. තවාන් පස සඳහා නිර්දේශිත ප්‍රමාණය වර්ග අඩි 100 කට රාත්තල් 2 ක් වේ.

මේරූ තේ වල පස් ධූමායනය පිළිබඳ අත්හද බැලීම් වලින් පෙනී ගියේ ධූමායනයෙන් පසු සැළකිය යුතු එලද වැඩිවීමක් නොමැති බවය. ධූමායනයෙන් මාස කිහිපයකට පසුව පසෙහි ජනගහනය මුලින් තිබූ තත්ත්වය තෙක්ම පත්ව ඇති බව පෙනී ගියේය. ප්‍රතිඵලයන් ගෙන් පෙනී ගිය තවත් කරුණක් නම් ඩී.ඩී. යෙදීමෙන් විෂකර ගතියක් ඇති නොවූවද, ඩබ්එන් 12 යෙදීමෙන් තරමක විෂකර ගතියක් ඇති වන බවය.

මැද රට පලාත්වල අසාර්ථක නව වගාවන් අතර රාශී වශයෙන් වට පණුවන් ගේ නව විශේෂයක් සොයා ගනු ලැබීය. හානියෙහි ලක්ෂණ නම් පී. ලූසායි විසින් කරනු ලබන හානියට බොහෝ සෙයින් සමාන විය. මෙම විශේෂයෙහි පැතිරීම පිළිබඳ සූක්ෂම ගවේෂනයක් ලඟදීම අරඹනු ඇත. ව්‍යාධි-ජනකතා අත්හද බැලීම් දැනටමත් සාන්ත කූම්බ්ස් හී ආරම්භ කොට ඇත.

කෘමි විද්‍යාව

කෘමි නාසකයන් 26 ක් ද, දිලීර නාසකයන් 2 ක් ද, ව්‍යාධිජනකයන් දෙකක් ද සම්බන්ධ වූ අත්හද බැලීම් වලින් පෙනී ගියේ ගස් ගුල්ලන් මර්ධනය සඳහා සතුටුදයක ප්‍රතිඵලයන් දුන්නේ හෙප්ටක්ලෝ පමණක් බවය. මේ කෘමියා මර්ධනය සඳහා හෙප්ට-ක්ලෝ, ඩියල්ඩ්‍රින් තරමටම ද එල්ඩ්‍රින් වලට වඩා ද යෝග්‍ය විය. හෙප්ටක්ලෝ මගින් ලබාගත හැකිවූ ගස් ගුල්ලන් මර්ධන කාලය මාස 15 ක් විය. අතුරු විපාක පිළි-බඳව සලකා බලන විට හෙප්ටක්ලෝ ඇල්ඩ්‍රින් හා ඩියල්ඩ්‍රින් හා සසඳා බලන විට හෙප්ටක්ලෝවලින්, අඩුම ටී ටොට්රික්ස් මර්ධනය සඳහා ඩී.ඩී.ටී. ඉසීමක් අවශ්‍ය නොවීය. අංගජනක පොස්පරස් සහ කාර්බනේට් කණ්ඩායම් වලට අයත් කෘමි නාසකයන් ගස්-ගුල්ලන් මර්ධනය සඳහා බලගතු නොවන බව පෙනිණ.

ෆෙනික්‍රෝයන් (සිමිතියොන් සහ ෆොලිතියොන්,) සහ ෆෙන්තියන්, එක්වරක් යෙදීමෙන් දෙමාසයක් කල් පවතින ගස්ගුලු මර්ධනයක් ලබා ගත හැකි විය. එහෙත් මෙසේ කිරීම ආර්ථිකමය නොවේ. මෙම අත්හද බැලීම් පදනම් කොට හෙප්ට-ක්ලෝ යොද ගස් ගුල්ලන් මර්ධනය කිරීම පිළිබඳ නිර්දේශ වතුයායන් වෙත දෙසැම්-බරයේ දී යවන ලද පත්‍රිකාවක් මගින් ඉදිරිපත් කරන ලදි. මෙම අලුත් නිර්දේශයන් ගෙන් ඉතාමත් අඩු අතුරු විපාක සහිතව ගස්ගුල්ලන් මර්ධනය කළ හැකිවේ යැයි කල්පනා කරනු ලැබේ. ඩියල්ඩ්‍රින් යෙදීම නිසා පහළවූ අතුරු විපාක පිළිබඳව 1967 අවසාන වන විට ආයතනයට කිසිම වාර්තා කිරීමක් නොවීය.

මහනුවර මැද රට ස්ථානයෙන් ලැබුනු වැදගත් සොයා ගැනීමක් වූයේ නිකල් ක්ලෝරයිඩ් යෙදීමෙන් ගස් ගුල්ලන් සියයට 23 ප්‍රමාණයකින් මර්ධනය කළ හැකි බවය. මෙම ස්ථානයේම, ගස් ගුල්ලන්ට ධාරණ ක්ලෝනයන් සෙවීමේ කටයුතු ඉදිරියට ගෙන ගිය අතර එයින් බොහොමයක්, ක්ෂෙත්‍ර අත්හද බැලීම්වල නම් පොරොන්දු සහිත විය.

කීඩැ නාසකයන් යොද කීඩැවන් මර්ධනය පිළිබඳ අත්හද බැලීම්වලින් පෙනී ගියේ කෙල්තේන් දියර අවුන්ස 10, (කලින් අවු. 15) හෝ ටිඩියොන්—වී 18 දියර අවුන්ස 10 (කලින් අවු. 30) අක්කරයකට යෙදීමෙන්, ලා දම්, හා රතු කීඩැවන් සාර්ථකව මර්ධනය කළ හැකි බවය. කීඩැ නාසක දෙක අතුරෙන් කෙල්තේන්වලින් සුපිරි ප්‍රතිඵල ලැබිණ. මෙම නව සොයාගැනීම් නිසා අක්කරයකට කෙල්තේන් සඳහා යන වියදම සියයට 33 කින් ද ටිඩියොන් සඳහා යන වියදම සියයට 200 කින් ද අඩුකර ගත හැකි වේ. වසර තුලදී කීඩැනාසක රාශියක් පරීක්ෂණයට භාජනය කරන ලදි. බයින-පකල් සහ මොරෙස්ටන් අනාගතයේ දී මයිටියන් මර්ධනය සඳහා වටිනාකමක් ඇති වෙතැයි හැඟින. මේ කීඩැ නාසකයන් ගෙන් තවත් පරීක්ෂණයන් ගෙන යා යුතු වේ.

කීඩෑවන් මර්ධනය කිරීමේ ආර්ථිකත්වය පිළිබඳව ගෙන යන ලද පරීක්ෂණයන් ගෙන් පෙනී ගියේ ඒ මර්ධනයන් ගේ ආර්ථිකත්වයක් තිබෙන බවය. එතරම්ම උග්‍ර නොවූ ලාරතු හා රතු මයිටියන් මර්ධනය කිරීමෙන් අක්කරයකින් වැඩිපුර රාත්තල් 75 ක් වසරක දී ලබාගත හැකිය. මයිටියන් මර්ධනය සඳහා වසරකට වැය වන්නේ අක්කර-යකට රු. 27 ක් පමණක් හෙයින් මයිටියන් මර්ධනය ආර්ථිකමය බව මැනෙවින් පෙනේ.

ජෛව රසායන විද්‍යාව

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථයන් වූයේ පහත රට තේ වල ගුණය වැඩි කිරීමේ ක්‍රමයක් සොයා ගැනීම හෝ ඇල්වතුරෙන් දිය කළ හැකි ක්ෂණික තේ නිපදවීමය. කලින් සඳහන් වූ දේ සම්බන්ධයෙන් සොයා ගත් ක්‍රමයක් සොයා ගෙන තාවකාලිකව ස්වාධිකාරී කළ අතර, අනෙක පිළිබඳ පයෝෂණ කටයුතු තවමත් කර ගෙන යේ. වියලි කලු තේ විශ්ලේෂණය කිරීම තව දුරටත් කර ගෙන ගිය අතර, කලු තේවල වඩා වැදගත් අනුකොටස්, වල ගබඩා කොට තැබීම නිසා ඇතිවන ක්‍රියාවන් පිළිබඳ කරුණු සොයනු ලැබීය. තේවල පෙනෙන එන්සයිමයන් තුනක ලක්ෂණ අධ්‍යයනය කරන ලදී. (පොලිපිනෝල්ඔක්සිඩේස්, ට්‍රාන්සීමෙයිනේස්, පොස්පටේස්). තේ කොළයෙහි පොලිපිනෝල්ඔක්සිඩේස් එන්සයිමය ඇති තැන් පිළිබඳ පත්‍රිකාවක් ටෝකියෝවේ පැවැති ජාත්‍යන්තර ජෛව විද්‍යා සම්මේලනයේ හත්වෙනි වාරයේ දී ඉදිරිපත් කරන ලදී. ඇමිනෝ ඇසිඩ් තියෙනින් තේ පැලයේ මුල්වල දී ජෛව සංශ්ලේෂණය වන බවද එතැන සිට තේ දළු වෙත යවන බව ද දැන ගැනීම සඳහා විකිරණශීල අන්වේශයන් උපයෝගී කර ගන්නා ලදී. සාන්ත කූම්බ්ස් හා ඌවේ වැවෙන තේවල තේ දළු අතර සහ එන්සයිමය, හා මැන්ගනීස් ප්‍රමාණය සෘතු අනුව වෙනස් වීම පිළිබඳව ගෙන ගිය අධ්‍යායනයන් ගෙන් පෙනී ගියේ මෙම රසායනික ප්‍රමාණයන් හා රස අතර සමහර විට යම් කිසි සම්බන්ධයක් තිබිය හැකි බවය. කැටකින්ස් සඳහා ඉසින ප්‍රතිකාරකයක් සොයා ගන්නා ලදි. තේ දළුවල ඇති ක්ෂුද්‍රශාක පිළිබඳව ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක අධ්‍යා-යනයන් ගෙන් පෙනීගියේ කාලගුණමය කරුණුවල වෙනස්වීම්, ක්ෂුද්‍ර ජීවී ජනගහණයේ ගුනාත්මක හා ප්‍රමාණාත්මක වෙනස් වීම් ඇති කරන බවය.

තේ කර්මාන්ත ශිල්පය

පහත රට කරන ලද කටයුතු අතර විශේෂ අවධාරණයක් යොදන ලද්දේ වානිජමය පරිමාණයෙන් රොටෝවේන් — සී. ටී. සී. තේ නිපදවීම සම්බන්ධව හා ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ ගේ සහයෝගයද ඇතිව පහත රට තේවල වර්ගය උසස් කිරීම සඳහා ක්‍රමයක් උපයෝගී කර ගැනීම සම්බන්ධ වය. රොටෝවේන් — සී.ටී.සී. ක්‍රමයට දැන් වානිජමය පරිමාණයෙන් සාන්ත ජොයකීම් හි තේ නිෂ්පාදනය කරනු ලැබේ. වෙළෙඳ පොළෙහි මේවාට ලැබෙන වටිනාකම දැන් දැනගත යුත්තෙමු. විශේෂයෙන්ම පැකට් කිරීමේ ලක්ෂණ සම්බන්ධයෙන් මේ සැදි තේ කරල් ස්වරූපයක් ගත යුතුද විවෘතව තිබිය යුතුද යන්න පිළිබඳව කොළඹ වෙළෙඳ අංශ අතර විවිධ මත පවතී.

පහත රට තේ සඳහා මේස පැසීම් ක්‍රමය වෙනුවට ජෝජ් විලියම්සන් පැසීම් ට්‍රොලි ක්‍රමය (අප්‍රිකා) භාවිතා කිරීමෙන්, බී.ඕ.පී. හෝ බී.ඕ.පී.එප්. වර්ග වල තේ සඳහා වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්වීමක් ලබා ගත නොහැකි විය.

මැද රට ස්ථානයේ ගෙන යන ලද අත්හද බැලීම්වලින් පෙනී ගියේ ද්‍රවමය ලක්ෂණ සම්බන්ධයෙන් මෙම දිස්ත්‍රික්කය සඳහා එම්පීජ්අයි ක්ලෝනය පොරොන්දු සහිත බවය. මැද රට තවත් වැදගත් කරුණක්ව පෙනුනේ කෘමි නාසකයක් වන හෙප්ටෙක්ලෝ යෙදීමෙන් තේ ද්‍රවයෙහි දුර්වර්ණ වීමක් ඇති නොවන බව පෙනීමය. එක්සත් රාජ-ධානියේ ජාතික පයෝෂණ සංවර්ධන සංස්ථාවේ සහාය ද ඇතිව, කර්මාන්ත ශිල්ප අංශය දැනට තරල පත්ල වියලන යන්ත්‍රයක් සෑදීමෙහි නිරත වී සිටියි. අවධානයට භාජනය වී ඇති අනෙක් වැදගත් කරුනු අතර සාන්ත කූම්බ්ස් හී, පිංෂණයකින් කරන ලද අත්හද බැලීම් ද විය. මෙම යන්ත්‍රයෙන් රොටෝවේන් මගින් නිපදවෙන තේ වලට සමාන තේ නිපද වේ. (ද්‍රවණ ලක්ෂණ සම්බන්ධයෙන්). මෙම යන්ත්‍රය වඩා ලිහිල් කිරීමටත්, තවත් දියුණු කිරීමටත් දැන් කටයුතු කර ගෙන යේ.

සංඛ්‍යාති

වසර තුළදී කරන ලද සියලුම කටයුතු ක්ෂෙත්‍ර, කම්හල් හා විද්‍යාගාර අත්හද බැලීම් සම්බන්ධ පිරිමැවුම, විශ්ලේෂණය හා සංඛ්‍යාති අර්ථ නිරූපනය කිරීම හා ආදළ විය. ව්‍යාප්ති අත්හද බැලීම් වලින් දත්තයන් ගලා එන්නට විය. පෙදෙස් අතර කැබෙලිවල

විවිධ වන ප්‍රමාණයන් නිසා මේවා සහවිචලතා විශ්ලේෂණයන්ට භාජනය කරන ලදි. මෙවැනි අත්හද බැලීම් විස්සක් විශ්ලේෂණය කරන්නට යෙදුණි. ලාභ යථාතථ්‍ය හා විවිධ පිරිමැවුම්වල විචලය සංගුණකය ගණන් බලනු ලැබූ අතර වක්‍රගත කරන ලදි.

උපදෙස් සේවය

රෝග හා පළිබෝධ

ගස් ගුල්ලන් මර්ධනය සඳහා ඩියල්ඩ්‍රින් විදීම පිළිබඳව වූ නිර්දේශය ඉවත් කිරීමත් සමඟම ටෝට්‍රික්ස් අතුරු විපාක, රිකිලි හා වට දළඹුවන් පහළවීමද ආදිය 1967 දී කැපී පෙනෙන සේ අඩු විය. වියලි සමයේදී පවා, තැනින් තැන පහළ වූ සීමිත අවස්ථා ස්වල්පයක් හැරෙන්නට මෙම පළිබෝධ ප්‍රශ්නයක් නොවීය. වසරතුළදී, ඩියල්ඩ්‍රින් හා ඇල්ඩ්‍රින් වෙනුවට හෙප්ටෙක්ලෝ භාවිතය පිළිබඳ තාවකාලික නිර්දේශයන් ඉදිරිපත් කරන ලදි. තවාන්වල වටපණුවන් මර්ධනය සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් ධූමායනය කිරීම දැන් සිරිතක් වශයෙන් බොහෝ වතුයායන් අනුගමනය කරන බව පෙනේ. බුබුලු අංගමාරය මර්ධනය කිරීම සඳහා තඹ වෙනුවට නිකල් ක්ලෝරයිඩ් යෙදීම සමහර වතුයායන් මගින් අත්හද බලන ලදි.

පොහොර

ආර්ථිකමය පියවරක් වශයෙන් පොටෑෂ් හා පොස්පරස් යොදන ප්‍රමාණය මේ අවුරුද්ද තුලදී තවත් අඩු කරන ලදි. සමහර වතුයායන් මේවා තමන්ගේ පොහොර යෙදීම් වැඩ සටහන් වලින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදි.

ව්‍යාප්ති අත්හද බැලීම්

1967 අවසාන භාගයේ දී නුවරඑළිය හා ඌව දිස්ත්‍රික්ක වල ගෙන යන ලද බොහෝ අත්හද බැලීම් ඒවා යොද අවුරුද්ද සම්පූර්ණ කළේය. මේ ප්‍රතිඵල සංඛ්‍යා ලේඛනාත්මකව විශ්ලේෂණය කරන ලදි. දැනට ලැබී ඇති තොරතුරු අනුව පොස්පේට් හා පොටෑස් විවිධ ප්‍රමාණයන්ට කිසිම ප්‍රතික්‍රියාවක් නොමැති බව හා නයිට්‍රෝජන් ලැබෙන මාර්ගය වශයෙන් යූරියා, ඇමෝනියම් සල්පේට්, හෝ කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් යෙදීමෙන් පලදාව අතර වෙනස්වීමක් නොමැති බවය.

ව්‍යාප්ති කටයුතු

ව්‍යාප්ති කටයුතු බොහෝ දුරටම එල්ල වූයේ ආයතනයේ 14 වෙනි සම්මේලනය හා ලංකාවේ තේ කර්මාන්තයේ ශත සාංවත්සරය සම්බන්ධයෙන් කොළඹ පැවැති ප්‍රදර්ශනය පිළිබඳවය.

අගරතැන්න අතුරු ස්ථානය

මෙම අතුරු ස්ථානයේ කටයුතු ඉදිරියට ගෙන ගිය අතර තවත් අක්කර විස්සක තේ උදුරා ගෞතමාලා තණ වවන ලදි. මේ අනුව තණ වවා ඇති ප්‍රමාණය අක්කර 40 ක් විය. අක්කර පහක පමණ ලැහැබ් පෙදෙසක අතරින් පතර තෝරා ගත් කොටස් 6 ක ක්ලෝන තේ වර්ග 30 ක් වවන ලදි.

පුස්තකාලය හා ප්‍රකාශණ

ආචාර්ය්‍ය ආර්. එල්. ද සිල්වා මහතා ආයතනයේ ප්‍රකාශණ වල සම කර්තෘ වශයෙන් තව දුරටත් ක්‍රියා කළ අතර පුස්තකාලය පරිපාලනය බාරව ද සිටියේය.

පුස්තකාලය

මිලදී ගැනීම හා හුවමාරු කර ගැනීමෙන් පුස්තකාලයට ලැබෙන සඟරා සංඛ්‍යාව 239 ක් විය. පුස්තකාලයට එකතු කළ ප්‍රකාශන ගණන 149 කි. ආයතනයේ ප්‍රකාශන නොමිළේ බෙද හරිනු ලබන සංඛ්‍යාව 2884 දක්වා ගෙන එමින් අවුරුද්ද තුළ දී එය 64 කින් වැඩි විය.

ජූනි/ජූලි යේදී පුස්තකාලය, අධ්‍යක්ෂවරයාගේ කාර්‍ය්‍යාලය අසල වූ ගොඩනැගිල්ලට ගෙන යන ලදි.

ලංකාවේ වානිජමය පරිමාණයෙන් තේ සිටුවා ශත වසරක් පිරීම සිහි කිරීම වස් තේ පයෙසීෂණායතනය විසින් පළ කරන්නට යෙදුණු විශේෂ ප්‍රකාශනයන් හේතු කොට ගෙන පුස්තකාල නිලධාරී පිරිසට අමතර කටයුතු රාශියක නිරත වන්නට සිදු විය. ඔවුන් ගේ සහයෝගය ස්තුති පූර්වකව අගේ කොට දක්වමු.

ප්‍රකාශන

ආයතනයේ ප්‍රකාශන නිකුත් කිරීම සම්බන්ධ කටයුතු අධික වශයෙන් වැඩි විය. තේ.ප.ආ. වාර්ෂික වාර්තාවෙහි පළමු වෙනි සහ දෙවෙනි කොටස් සැසි වාර්තාවක් වශයෙන් සිංහලෙන් ද දෙමළෙන් ද ඉංග්‍රීසියෙන් ද පළ කරන්නට වීම නිසා මෙසේ කටයුතු අධික විය. අනාගතයේ දී මෙය චාරිත්‍රයක් වශයෙන් දිගටම කර ගෙන යනු ඇත.

ක්ෂෙත්‍ර කටයුතු පිළිබඳ තේ.ප.ආ. උපදෙස් පත්‍රිකා පළකිරීමේ කාර්‍යය පොස්ටර් බාර්හැම් මහතාගෙන් ආචාර්‍ය ආර්. එල්. ද සිල්වා බාර ගත්තේ ය. පොස්ටර් බාර්හැම් මහතා ආයතනයේ සේවයෙන් පසු දිවයිනෙන් පිට විය.

ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ නිබන්ධන—අංක 6 "ලංකාවේ කෘමි හා කීඩෑ පළිබෝධ හා ඒවා මර්ධනය කිරීම" ජේ. ඊ. ක්‍රැනම් මහතා විසින් නිබන්ධිත මෙම ග්‍රන්ථය ඔක්තෝබරයේ දී නිකුත් කරන ලදි. මෙම නිබන්ධනයෙහි පළ කරන ලද වර්ණ ඡායා 41 ක් සම්බන්ධයෙන්, ලංකාවේ සීමාසහිත ෂෙල් සමාගම ද ෂෙල් ජාත්‍යන්තර තෙල් සමාගම විසින් ද දෙන ලද මුදල්මය සහාය ද අගේ කොට සළකමු. ලංකා තේ ශත සාංවත්සරය නිමිත්තෙන් විශේෂ ප්‍රකාශයන් 3 ක් නිකුත් කරන ලදි. මෙයින් දෙකක් තේ ත්‍රෛමාසිකයේ විශේෂ අංක දෙකක් විය. ජූනියේ දී පිටු 165 ක් සහිත සමාලෝචනය වන ලිපි සහිත අංකයක් පළ කරන ලදි. පළමු වන කෘෂිකර්ම රසායන විද්‍යාඥ හා ශාක භෞතවේදී වූ ආචාර්‍ය ටී. ඊඩන් හා ආචාර්‍ය එජ්. ආර්. ටබ්ස් විසින් සපයන ලද ලිපි පිළිබඳ ව අපේ ස්තුතිය පළ කරමු. ඩී. එම්. පොරස්ට් මහතා ගේ ලිපියට ද අපේ ස්තුතිය හිමි වේ.

සැප්තැම්බරයේ නිකුත් කළ තේ ත්‍රෛමාසිකය තේ.ප.ආ. තේ සාංවත්සර සම්මේලනයේ කටයුතු පළ කිරීම සඳහා වෙන් කරන ලදි. මෙහි දී ඉදිරිපත් කළ බොහෝ පත්‍රිකා පයෙසීෂණයන් ගේ ප්‍රතිඵල විය. තේ පයෙසීෂණායතනය පිළිබඳ සවිස්තරාත්මක අත් පොතක් අවුරුද්ද තුල දී පිළියෙල කරන ලද අතර ශත සාංවත්සර සම්මේලන සතිය තුල දී නිකුත් කරන ලදි. තේ ත්‍රෛමාසිකයේ 38 වෙනි වෙළුම එය පළ කරන්නට වූ අවුරුදු 40 තුළ දී නිකුත් කළ විශාලම අංකය වේ.

තේ පයෙසීෂණායතනයේ ඡායාරූප ශිල්පී ඩී. ජේ. එම්. හෙට්ටිආරච්චි මහතාගේ ද ඔහුගේ සහකරු වූ ඩී. එල්. ඤෑඤෑ මහතාගේ ද සහාය මෙහි දක්වන්නේ මහත් සතුටිනි. අවුරුද්ද තුළ තේ පයෙසීෂණායතනයේ ප්‍රකාශනයන් නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔවුන් ගෙන් ලැබූ සහාය සුළුපටු නොවේ.

වතුයා

සාන්ත කුම්බ්ස් වතුයාය ද සාන්ත ජොයකිම් වතුයාය ද තේ ශත සාංවත්සර සම්මේලන සතියේ දී අමුත්තන් සඳහා විවෘත විය. අවුරුද්ද තුළ දී මෙම වතුයා දෙකෙහිම තේ සඳහා ලද මිල සතුටුදයක විය. සාන්ත ජොයකිම් තේ වලට ලැබුණු මිළ පහත රට තේ සඳහා ලැබුණු වැඩි මිළක් විය. වතුයා දෙකම වැඩ වර්ජන නොමැතිව හොඳින් පවත්වා ගෙන යා හැකි විය.

ස්තුතිය

ආයතනයේ අත්හද බැලීම් වැඩ සටහන් මෙහෙයවා ගෙන යෑම් වස්, ලංකා වැවිලි කරුවන්ගේ සංගමය, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය සියළුම වතුයාවල අධිකාරීන් හා උප අධිකාරීන් ගෙන් ලැබුණු ධෛය්‍යීය ද සහයෝගය ද පිළිබඳ ආයතනයේ කෘතඥ පූර්වක ස්තුතිය මෙහි ලා සඳහන් කරමු.